අභ්‍යන්තර සටහන

පළාත් මහ රෝහල - බදුල්ල

| | |
|---|---|
| දිනය | 2022-09-23 |
| වෙත | සියළුම කාර්ය මණ්ඩලය වෙත |
| වෙතින් | අධ්‍යක්ෂ |
| පිටපත් | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය |
| විෂයය | ජනමාධ්‍ය වෙත ප්‍රකාශ නිකුත් කිරීම |
| ගොනු අංකය | BD/PGH/CPHMA/1/2013 |

ජනමාධ්‍ය වෙත ප්‍රකාශ නිකුත් කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය ලේකම් විසින් නිකුත් කර ඇති MH/Add/Sec/Admin1/03/2022 හා 2022-09-21 දිනැති ලිපිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. (අදාළ ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.)

02. ඒ අනුව, සෞඛ්‍ය සේවාව කෙරෙහි මහජනතාවගේ විශ්වාසය ආරක්ෂාවන අන්දමින් කටයුතු කිරීම ඔබගේ වගකීමක් වන බැවින්, රජයේ නිලධරයන් ජනමාධ්‍ය ඔස්සේ ප්‍රකාශ සිදු කිරීමේදී ආයතන සංග්‍රහයේ පවත්නා විධිවිධානවලට හා චක්‍රලේඛ හා උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතු බව අවධාරණය කරමි.

03. ඒ අනුව, සෞඛ්‍ය ලේකම්ගේ උක්ත සඳහන් ලිපියෙහි සඳහන් කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කර, ඒ අනුව කටයුතු කරන ලෙසත්, ආයතන සංග්‍රහයේ පවත්නා විධිවිධානවලට, චක්‍රලේඛ හා උපදෙස් වලට අනුකූලව කටයුතු නොකරන නිලධාරින් සම්බන්ධව සෞඛ්‍ය ලේකම්ගේ නියෝගය පරිදි විනයානුකූලව කටයුතු කිරීමට දන්වා යැවීමට සිදුවන බවත් මෙයින් වැඩිදුරටත් දැනුම් දෙමි.

04. සෞඛ්‍ය සේවාව කෙරෙහි මහජනතාවගේ විශ්වාසය ආරක්ෂාවන අයුරින් කටයුතු කිරීමට ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සළකමි.

Dr. Upul Karunarathne
MBBS.MSc (Med.Admin). MD(Med.Admin)
Director
Provincial General Hospital
Badulla.
23/9/22

දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේ අංකය ) MH/Add/Sec/Admin1/03/2022
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය ) 2022.09. 21
திகதி )
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

23 SEP 2022

සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරු
සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් සියලුම ආයතන ප්‍රධානින්
සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු
සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු ඇතුළු
සියලුම නිලධරයන් වෙත,

**ජනමාධ්‍ය වෙත ප්‍රකාශ නිකුත් කිරීම**

මහජන විශ්වාසය තහවුරු කරගනිමින් කාර්යක්ෂම සෞඛ්‍ය සේවාවක් සැපයීම සඳහා නිවැරදි දත්ත මත පදනම් වූ සෞඛ්‍ය සේවාව සම්බන්ධ තොරතුරු විධිමත්ව මහජනතාව වෙත ලබා දීම අත්‍යාවශ්‍ය කරුණකි. ඒ අනුව අදාල තොරතුරු ජනමාධ්‍ය වෙත නිකුත් කිරීම සඳහා මා විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාල නිලධාරීන් වෙත බලය පවරා ඇත. නමුත් රේඛීය අමාත්‍යාංශය යටතේ හා පළාත් සභා සෞඛ්‍ය සේවය යටතේ සේවය කරනු ලබන ඇතැම් නිලධාරීන්, විවිධ කණ්ඩායම් සෞඛ්‍ය සේවය සම්බන්ධ නිවැරදි නොවන තොරතුරු හා සෞඛ්‍ය ප්‍රතිපත්තීන් විවේචනය කරමින් විධිමත් අනුමැතියකින් තොරව ජනමාධ්‍ය වෙත අදහස් ප්‍රකාශ කිරීමේ සිදුවීම් ගණනාවක් මේ වන විට මා වෙත වාර්තා වී ඇත.

02. රජයේ නිලධරයන් ජනමාධ්‍ය ඔස්සේ ප්‍රකාශ සිදුකිරීම සම්බන්ධයෙන් විධිවිධාන පවතින ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVII වන පරිච්ඡේදයේ 6 සහ 7 වගන්තීන් කෙරෙහි ද ආණ්ඩුවේ ප්‍රතිපත්ති හෝ පරිපාලන ක්‍රියාමාර්ග හෝ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීම හා විවේචනය කිරීම සම්බන්ධයෙන් විධිවිධාන පවතින ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XXXI වන පරිච්ඡේදයේ 3 වගන්තිය කෙරෙහි ද එම වගන්තිය සංශෝධනය කරන ලද 2019.02.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2019 කෙරෙහි ද සියලුම නිලධරයන්ගේ විශේෂ අවධානය යොමු කරවනු ලැබේ.

03. ඒ අනුව සෞඛ්‍ය සේවාව කෙරෙහි මහජනතාවගේ විශ්වාසය ආරක්ෂා වන අන්දමින් කටයුතු කිරීම සඳහා උක්ත විධිවිධාන නොසලකා කටයුතු කරන සෞඛ්‍ය සේවාවට අයත් සියලුම නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බව කාරුණිකව දන්වමි.

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත
ලේකම්.

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.